## මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය – 2013

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, අරමුදල් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උපවගන්තිය සහ 2005 අංක 02 දරන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා නියමාවලිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී.ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ **2.2** ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ **2.2** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් **2013** දෙසැම්බර් **31** දිනට මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පශ්චාත් උපාධි ප්‍රදානයන් ලබාදී පසුව අවලංගු කර තිබූ ප්‍රදානලාභීන් අට දෙනෙකුගෙන් ලැබිය යුතු රු.**6,228,732** ක් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය වත්කම් ලෙස හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2 විගණනයට ඉදිරිපත් නොවූ සාක්ෂි**

අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම සඳහා ලියාපදිංචි ගාස්තු ලෙස 2013 පෙබරවාරි 11 දින බාහිර සමාගමක් වෙත රු.24,000 ක් ගෙවීම් කර තිබුනද අදාල ආයතනය සමඟ අත්සන් කරන ලද විධිමත් ගිවිසුමක් විගණනය වෙත ඉදිරිපත් නොවීය.

**2.2.3 නීති රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| <u>නීති ,රීති, රෙගුලාසි යනාදියට යොමුව</u> | <u>අනුකූල නොවීම්</u> |
|---|---|
| (අ) 2005 අංක 2 දරන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා නියමාවලියේ 16(1) ඡේදය | මධ්‍යස්ථානයේ පූර්ණ කාලීන නිලධාරියකු එහි අධ්‍යක්ෂවරයා විය යුතු වුවද 2011 වර්ෂයේ සිට වැඩ බැලීමේ පදනම මත පූර්ණකාලීනව අධ්‍යක්ෂවරයකු පත් කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි **756** | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන් අදාල ආකෘතීන්ට අනුකූලව සකස්කර නොතිබුණු අතර භාණ්ඩ වල සත්‍ය ශේෂය පමණක් වාර්තා කර තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.166,709 ක අතිරික්තයක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.223,210 ක අතිරික්තයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.56,501 කින් අඩුවීම සඳහා පුද්ගල පඩිනඩි වියදම රු.485,172 කින්ද, ශිෂ්‍යත්වගත සේවා රු.482,489 කින්ද, සේවක හා ආයතන සංවර්ධන අරමුදල සඳහා වෙන්කිරීම රු.725,000 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

නිශ්චිත වශයෙන් ප්‍රාග්ධන හා අයභාර අයවැය ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා පුනරුත්ථාපන සඳහා වූ ප්‍රාග්ධන ප්‍රදාන හා පවරා ගැනීම් ප්‍රදාන වලින් පිළිවෙලින් රු.500,000ක් හා රු.1,210,879 ක් පශ්චාත් උපාධි ප්‍රදාන ගිණුමට මාරු කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශිෂ්‍යත්ව ලාභියෙකු දර්ශනවේදී උපාධියක් වසර 03 සිට වසර 05 දක්වා කාල සීමාවක් තුළ අවසන් කළ යුතු වුවද 2005 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා එකතුව රු.74,508,750 ක ප්‍රදාන ලබා දී තිබුණු ප්‍රදානලාභීන් හැත්තෑදෙදෙනෙකු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පාඨමාලා අවසන් කර නොතිබුණි.

(ආ) විදේශ රටක අධ්‍යයන කටයුතු සඳහා ප්‍රදාන ලබාගෙන ලියාපදිංචි වී තිබූ කථිකාචාර්යවරයකු එක් අවුරුද්දක ප්‍රදාන කොටස ලබා ගැනීමෙන් පසු එම ශිෂ්‍යත්වය අවලංගු කර නැවත මෙරට විශ්වවිද්‍යාලයක එම අධ්‍යයන කටයුතු සඳහා ලියාපදිංචි වී තිබුණු අතර මූල්‍යමය වශයෙන් මධ්‍යස්ථානය වෙත පාඩුවක් සිදුනොවුනත් එම අවස්ථාවේ ලබාදෙන ප්‍රදාන මුදල් උපයෝගීකරගෙන මෙරට හෝ විදේශයක අධ්‍යයන කටයුතු කිරීමට හැකියාව ඇති තවත් අයදුම්කරුවෙකු හෝ කිහිපදෙනෙකුට තිබෙන අවස්ථාව අහිමිවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

අත්තිකාරම් ලබාදීමේදී අවශ්‍යතාවය අනුව ඇස්තමේන්තු පිළියෙල කර ඒ අනුව අදාල අත්තිකාරම් ලබා නොදීම හේතුවෙන්, ලබා දී තිබූ අත්තිකාරම් මුදලින් සියයට 62 සිට සියයට 81 දක්වා මුදල් නැවත භාර දී තිබූ අවස්ථා තුනක් නියැදි විගණනයේදී අනාවරණය විය.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව පිහිටුවන ලද සේවක හා ආයතන සංවර්ධන අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,000,000 ක් අරමුදලට බැර කර තිබුණි.

(ආ) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කළමනාකරණ සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පමණක් පාඨමාලා හා වැඩමුළු සඳහා සම්පත් දායකයින්ට හා ආයතන නිලධාරීන්ට විවිධ රේටයන්ට අනුව ගෙවීම් කර තිබුණි.

(ඇ) මධ්‍යස්ථානයේ රු.1,125 බැගින් දෛනික වැටුප් ලබන පරිගණක යෙදුම් සහයකගේ කාර්යපැවරුම් ලේඛනය අනුව පාඨමාලා සඳහා සහාය වීම, සඳහන් වී තිබුණ ද පරිගණක යෙදුම් සහකරු වෙත Certificate course Introduction to SPSS for Statistical Analysis පාඨමාලා 04 සඳහා එකතුව රු.36,000 ක් අදාළ රේටයට පටහැනිව ගෙවීම් කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණද වාර්ෂික අයවැය සමඟ හා මූල්‍ය ප්‍රකාශන සමඟ සමගාමී නොවූ හෙයින් ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක ඉටුකර ගැනීමේ ප්‍රගතිය පිළිබඳව සමාලෝචනයක් කළ නොහැකි විය.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන චක්‍රලේඛයේ 5.2.1 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර අයවැය ගත වියදම් හා තත්‍ය වියදම් අතර සියයට 13 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයන් පැවතියෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

2011 ජූලි 05 දින පවත්වන ලද පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී ලබාදී ඇති නියෝගය අනුව නියමාවලියේ සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් බැහැරවූ වෙනත් ක්ෂේත්‍රයන්ට සම්බන්ධ ආචාර්යවරුන්ට ප්‍රදානයන් කිරීමට අවශ්‍ය නම් නියමාවලිය සංශෝධනය කළයුතු බව සඳහන් කළද 2013 දෙසැම්බර් 31 දින වන විටත් නියමාවලිය සංශෝධනය කිරීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග යොදා නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ප්‍රදාන ලබා දීම

(ආ) වැඩමුළු, දේශන හා පාඨමාලා පැවැත්වීම

(ඇ) අත්තිකාරම් ලබා දීම